සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

62	S	I

Grade 10 - Diagnostic Test – August 2022
අනාවරණ පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 1
Time: 1 hour

Civic Education – I
පුරවැසි අධ්‍යාපනය - I

Name: - ..... class: -..... Index no: - .....

- අංක 01 සිට 40 දක්වා දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(01) සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලුවක් වන්නේ,

(i) වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම
(ii) පුද්ගලයන් අතර පවත්කා මත ගැටුම
(iii) විවිධ පක්ෂ ගණනාවක් තිබීම
(iv) රටේ පුරවැසියන්ගේ ආදායම් විෂමතාව

(02) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක වන්නේ ,
1. එංගලන්තය හා ජර්මනියයි
2. ඉතාලිය හා ස්පාඤ්ඤයයි
3. ඕලන්දය හා පෘතුගාලයයි
4. එංගලන්තය හා ප්‍රංශයයි

(03) ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය හැඳින්වූයේ,
1. මහජන කවුන්සිලය යනුවෙනි
2. පුරවැසි සභාව යනුවෙනි
3. උත්තර මණ්ඩලය යනුවෙනි
4. පෙන්ටගන යනුවෙනි

(04) පලාත් සභාවක නිල කාලය වසර,
1. තුනකි
2. හතරකි
3. පහකි
4. හයක

(05) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියා විසින් ඉටුකළ යුතු සාදාචාරාත්මක යුතුකමක් වන්නේ,
1. පවතින නීතියට ගරු කිරීමයි
2. වැඩිහිටියන්ට ගරු කිරීමයි
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමයි
4. නීතිය හා සාමය ආරක්ෂා කිරීමයි

(06) දේශපාලන අවබෝධයෙන් යුත් ජනතාවක් රටක සිටීම නිසා,
(i) ආණ්ඩුවේ කටයුතු විවේචනය කළ හැකි ය.
(ii) විරුද්ධ පක්ෂයේ ජනප්‍රියතාව වැඩි කළ හැකි ය.
(iii)මහජනතාවට හිතකර ආණ්ඩුවක් පත්කළ හැකි ය.
(iv)පුද්ගල හැකියා දියුණු කරගත හැකි ය.

(07) බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකි,
1. ඇමරිකා එක්සත් ජනපදය
2. බ්‍රිතාන්‍ය
3. උතුරු කොරියාව
4. ඉන්දියාව

(08) ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ප්‍රධාන අමාත්‍යවරයා පත් කරන්නේ,

1. ජනාධිපතිතුමා
2. අග්‍රාමාත්‍යතුමා
3. කථානායකතුමා
4. ආණ්ඩුකාරවරයා

(09) නගර සභාවේ ප්‍රධානියා හඳුන්වන්නේ,

1. නගරාධිපති
2. සභාපති
3. පුරපති
4. මන්ත්‍රී

(10) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන වාසියක් වන්නේ,

1. පාලනයේ ක්‍රමවත් බව ස්ථාවර බව
2. ආර්ථික ප්‍රතිලාභ සැමවිටම හිමිවීම
3. පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීම
4. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා නොවීම

(11) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සිදු කරන ආයතනය ,

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
2. මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව
3. පැෆරල් සංවිධානය
4. මිනින්දෝරු දෙපාර්තමේන්තුව

(12) මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම්,

1. නිදහස යනුවෙන් හැඳින්වේ
2. සමානාත්මතාව යනුවෙන් හැඳින්වේ.
3. අයිතිවාසිකම් යනුවෙන් හැඳින්වේ
4. සහජීවනය යනුවෙන් හැඳින්වේ.

(13) " රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්ති වලට හැරවීමත් ඒවා ක්‍රියාවට නැංවීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ." මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

1. මහාචාර්ය ගානර් ය.
2. ඇරිස්ටෝටල් ය.
3. ඒ.වී. ඩයිසි ය.
4. මහාචාර්ය කේ.සී. මියරේ ය.

(14) විවිධත්වය තුලින් ඒකියත්වය ළඟා කර ගැනීමට මග සාදන ආණ්ඩු හඳුන්වන නාමය,

1. සන්ධීය ආණ්ඩු
2. ඒකීය ආණ්ඩු
3. ඒකාධිපති ආණ්ඩු
4. හමුදා ආණ්ඩු

(15) ප්‍රජාතාන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,

1. සර්ව ජන ඡන්ද බලය යනුවෙනි
2. පරමාධිපත්‍ය බලය යනුවෙනි
3. නීතියේ ආධිපත්‍ය බලය යනුවෙනි
4. නීත්‍යානුකූල බලය යනුවෙනි

(16) පහත ප්‍රකාශ අතුරින් ඡන්දදායකයාගේ වගකීම සඳහන් ප්‍රකාශය තෝරන්න,

1. රට ගොඩනැගීමට කැපවීමක් ඇති නායකයින් තෝරා ගැනීම
2. පිළිගත් පරම්පරාවකින් පැවත එන නායකයින් පත් කිරීම
3. බලයේ සිටින නායකයන්ට විරුද්ධ කණ්ඩායමක් තෝරා ගැනීම
4. නව අපේක්ෂකයන් නියෝජිතයින් ලෙස තෝරා ගැනීම

(17) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණ සඳහා වර්තමානයේදී භාවිතා කරන නියෝජන ක්‍රමය මින් කුමක්ද?

1. සරල බහුතර
2. සමානුපාතික
3. සමාන්තර
4. දිස්ත්‍රික්

(18) ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයක් නොවන්නේ,

1. විදේශ කටයුතු
2. විදේශ රටවල් හා ගිවිසුම් වලට එළඹීම
3. අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය
4. ආරක්ෂක හා හමුදා කටයුතු

(19) ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික් සංඛ්‍යාව,

1. 22 කි
2. 23 කි
3. 24 කි
4. 25 කි

(20) ජාතික රාජ්‍ය සංකල්පය ශක්තිමත් කිරීමට දායක වූ දේශපාලන චින්තයන් වන්නේ,

1. මාර්ටින් ලූතර් කිං , මැකියා වෙල්ලි , ජීන් බොඩැන්
2. මැකියා වෙලි , ජීන් බොඩැන් , තෝමස් හොබ්ස්
3. සිලර් , ටී.බී. ටයිලර් , චාර්ල්ස් ඒ. එල්වුඩ්
4. ලෙනින් , මාර්ටින් ලූතර් කිං , තෝමස් හෝබ්ස්

(21) බ්‍රිතාන්‍ය පාලන සමයේ ප්‍රථම වරට ස්ථාපනය කරන ලද මහනගර සභා වන්නේ,

1. කොළඹ , ගාල්ල
2. කොළඹ , මහනුවර
3. කොළඹ , ගම්පහ
4. කොළඹ , කළුතර

(22) තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,

1. ජනමතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම
2. ආණ්ඩුව විවේචනයට ලක් කිරීමට හැකි වීම
3. අත්තනෝමතික පාලනයක් බිහිවීම
4. ජාතීන් සඳහා වෙන වෙනම පක්ෂ නිර්මාණය කිරීම

(23) ස්විස්ටර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාන්ත ආණ්ඩු සංඛ්‍යාව,

1. 13 කි
2. 50 කි
3. 26 කි
4. 19 කි

(24) පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය හඳුන්වන්නේ,

1. මහ සභාව
2. පාර්ලිමේන්තුව
3. නගර සභාව
4. අමාත්‍යාංශ

(25) පාසල් පරිසරයේදී වුව ද සිසුන් වශයෙන් ප්‍රජාතාන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස ඔබට වැදගත් වේ. මෙම අදහසට නොගැලපෙන පිළිතුර තෝරන්න.

1.සමානාත්මතාවයෙන් කටයුතු කිරීම
2.සාකච්ඡා මගින් තීරණ ගැනීම
3.නායකත්වයට ගරු කිරීම
4.අන්‍ය මත නොඉවසීම

(26) පළාත් සභාවල කාර්ය භාරය සලකා බැලීමේදී සමගාමී ලැයිස්තුවට අයත් කාර්යයක් නොවන්නේ,

1. සැලසුම් කිරීම
2. විදේශ කටයුතු
3. ජාතික නිවාස හා ඉදි කිරීම්
4. කෘෂිකර්මය හා ගොවිජන සේවා

(27) පහත කරුණු අතරින් නිදහස් හා සාධාරණ මැතිවරණයක පැවතිය යුතු ලක්ෂණ ඇතුලත් පිළිතුර තෝරන්න.

A. නියමිත කාලයට මැතිවරණ පැවැත්වීම
B. ලියාපදිංචි සියලුම පක්ෂ මැතිවරණයට සහභාගී කර ගැනීම
C. නීතිරීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම
D. සියලුම රටවැසියන්ට ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව ලබාදීම

1. A හා B නිවැරදිය
2. A හා C නිවැරදිය
3. A හා D නිවැරදිය
4. B හා D නිවැරදිය

(28) ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම කිරීම ආරම්භුනේ,

1. පණ්ඩුකාභය රාජ්‍ය සමයේදී ය.
2. මහා පරාක්‍රම රජු සමයේදී ය.
3. බටහිර ජාතීන්ගේ ආක්‍රමණ වලින් පසුව ය.
4. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

(29) රටක ජනමතය ගොඩනැගීම සඳහා බලපාන ප්‍රබලම සාධකය වන්නේ,

1. ජනමාධ්‍ය
2. දේශපාලන පක්ෂ
3. දේශපාලන නායකයින්
4. විද්වතුන්ගේ මත

(30) ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලන කටයුතු සඳහා සහභාගී වීමට අවස්ථාව ලැබුනේ,

1. සියලු පුරවැසියන්ටය
2. වහලුන්ට
3. නගරවැසි කාන්තාවන්ට
4. විදේශිකයන්ට

(31) පළාත් සභා මැතිවරණයකදී ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලබන්නේ කවර පරිපාලන ඒකකයක්ද,

1. පළාත
2. දිස්ත්‍රික්කය
3. ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශය
4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

(32) ජනාධිපති ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණය වන්නේ,

1. පාර්ලිමේන්තුව විසින් තේරී පත් වූ විධායකයක් සිටීමය.
2. විධායක බලය භාරුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසින්ය.
3. විධායකය සෘජුවම පාර්ලිමේන්තුවට වගකිව යුතුය.
4. ආණ්ඩුව පරාජයට පත් කිරීමේ හැකියාව ව්‍යවස්ථාදායකය සතු වීමය.

(33) සමාජය තුළ ජීවත් වන පුද්ගලයින් සහ පවතින සමාජ සංවිධාන අභිබවා කටයුතු කිරීමට සමාජයට ඇති හැකියාව හඳුන්වන්නේ,

1. දේශපාලන බලය
2. ආර්ථික බලය
3. සමාජ බලය
4. පරිපාලන බලය

(34) ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ,

1. මහජන කැමැත්ත මත පාලනය සිදුවන නිසා ය
2. සාකච්ඡා මගින් තීරණවලට එළඹීම නිසා ය
3. සම්මානාත්මතාව ගරු කිරීම නිසා ය
4. මිනිස් අයිතිවාසිකම්වලට ගරු කිරීම නිසා ය.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(35) ස්විස්ටර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වන නාමය කුමක්ද?

1. ප්‍රාන්ත
2. මණ්ඩල
3. කැන්ටන්
4. මහා මණ්ඩල

(36) ශ්‍රී ලංකාවේ බලතල විමධ්‍යගත කිරීමේදී ඉහළම මට්ටමේ සිටින නිලධාරියා වන්නේ,

1. අමාත්‍යාංශ ලේකම්
2. ප්‍රාදේශීය ලේකම්
3. දිස්ත්‍රික් ලේකම්
4. ග්‍රාම නිලධාරි

(37) සන්ධිය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා පැවතිය යුතු ගුණාංගයකි,

1. සියලු ජනකොටස් පොදු හැඟීමෙන් කටයුතු කිරීම
2. මධ්‍යම ආණ්ඩුවට වාසි වනසේ සෑම විටම කටයුතු කිරීම
3. ආර්ථික තීන්දු ගැනීමේ වගකීම ප්‍රාන්ත වලට පැවරීම
4. මූල්‍ය ගනුදෙනු වලදී මධ්‍යම ආණ්ඩුවට ප්‍රමුඛත්වය ලබාදීම

(38) පළාත් සභාවක සතු ප්‍රධානම කාර්යය වන්නේ,

1. ප්‍රභූප්ති සකස් කිරීමයි
2. ප්‍රභූප්ති සම්පාදනය හා ඒවා සම්මත කිරීමයි
3. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමයි
4. අය වැය ලේඛනය සම්මත කිරීමයි

(39) ප්‍රජාතාන්ත්‍රවාදී පාලන ක්‍රමයක සමාන අයිතිවාසිකම් හිමිවීම,

1. සමාජ ගැටුම් අවම වීමට හේතු වේ.
2. පාලනය ක්‍රමවත් වීමට හේතු වේ.
3. පෞද්ගලික කුසලතා වර්ධනයට හේතු වේ.
4. යුතුකම් ඉටු කිරීමට හේතු වේ.

(40) සාදාචාරාත්මක යුතුකම් ඉටු කිරීමේ විනිශ්චයකරුවා බවට පත් වන්නේ,

1. අධිකරණ විනිශ්චයකරුවන්ය.
2. අග්‍රවිනිශ්චයකරුගේ උපදෙස්ය.
3. නීතිපතිතුමාගේ උපදෙස්ය.
4. පුද්ගලයාගේ හෘදය සාක්ෂියයි.

(ලකුණු 1x40=40)

PAST PAPERS WIKI

සියලු හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

62	S	II

Grade 10 - Diagnostic Test – August 2022
අනාවරණ පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 2
Time: 2 hours

Civic Education – II
පුරවැසි අධ්‍යාපනය - II

Name: - ..... class: -..... Index no: - .....

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

(01) i. ප්‍රජාතන්ත්‍රවාදය යන්න හඳුන්වන්න.
ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.
iii. ඒකීය පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් 02 ක් ලියන්න.
iv. උගව පළාතට අයත් දිස්ත්‍රික්ක 02 නම් කරන්න.
v. ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමේ ප්‍රධාන නිර්ණායක 02 නම් කරන්න.
vi. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරන ලද්දේ කවදාද?
vii. සන්ධීය ආණ්ඩුවක ප්‍රධාන බල අධිකාරී ආයතන දෙක සඳහන් කරන්න.
viii. ඇමරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතු 02ක් ලියා දක්වන්න.
ix. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 02ක් නම් කරන්න.
x. පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු බලතල 02ක් ලියන්න.

(02) " ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාමකාමී රටක් ගොඩනගයි."
i. ප්‍රජාතන්ත්‍රවාදය යන්න සිලර් විසින් නිර්වචනය කර ඇත්තේ කෙසේද? (ල02)
ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 03ක් සඳහන් කරන්න. (ල03)
iii. ප්‍රජාතන්ත්‍රවාදය අගයන පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග 02ක් සඳහන් කරන්න. (ල03)

ආ) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීම සඳහා අවශ්‍ය සාධක 02ක් ලියා ඉන් එක් සාධකයක් විස්තර කරන්න. (ල03)

(03) " රාජ්‍ය ස්ථාවර ආයතනයක් වන අතර ආණ්ඩු වරින්වර වෙනස්වීම් වලට භාජනය වන ආයතනයකි."
i. රාජ්‍යයක් තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ 02ක් නම් කරන්න. (ල02)
ii. යුරෝපයේ ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු 03ක් සඳහන් කරන්න. (ල03)
iii. ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන ආයතන 03ක් නම් කරන්න. (ල02)

ආ) ඉන් එක් ආයතනයක කාර්ය භාර්ය කෙටියෙන් විස්තර කරන්න. (ල03)

(04)
i. සර්ව ජන ඡන්ද බලය හිමිවීම සඳහා පුද්ගලයෙකුගෙන් සපුරාලිය යුතු සුදුසුකම් 02ක් සඳහන් කරන්න. (ල02)
ii. ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන මැනිවරණ 03ක් නම් කරන්න. (ල03)
iii. ප්‍රජාතාන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යයන් 02ක් ලියා දක්වන්න. (ල02)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ආ) රටක මාධ්‍ය නිදහස හා තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු වීම යහපාලනයක් සඳහා ද හේතුවේ. මෙම කියමන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකු03)

(05) i. භූතන රාජ්‍යයන්හි මූලික වශයෙන් දක්නට ලැබෙන ආණ්ඩුක්‍රම දෙක නම් කරන්න. (ලකු02)
ii. ඉන් එක් ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණ 03ක් සඳහන් කරන්න. (ලකු03)
iii. අ) ආණ්ඩුව නම් පාලන කටයුතු පවත්වාගෙන යාමේදී ජන සමාජයට ඉටුවිය යුතු වගකීම් 02ක් සඳහන් කරන්න. (ලකු02)
ආ) අනාගත පුරවැසියෙකු වශයෙන් ඔබෙන් රටට ඉටුවිය යතු යුතුකම් 02ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකු03)

(06) i. බලය විමධ්‍යගත කිරීම යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකු02)
ii. ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීම සඳහා ගෙන ඇති උත්සාහයන් 03ක් සඳහන් කරන්න. (ලකු02)
iii. පළාත් පාලන ආයතන පිහිටුවීමේ ප්‍රධාන අරමුණු 02ක් ලියන්න. (ලකු02)
ආ) ඔබ ප්‍රදේශය අයත් පළාත් පාලන ආයතනය මගින් සිදු කරන සේවාවන් 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකු03)

ආ) රටක මාධ්‍ය නිදහස හා තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු වීම යහපාලනයක් සඳහා ද හේතුවේ. මෙම කියමන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකු03)

(07) "සෑම ආකාරයකම අධිකාරි බලය එක් මධ්‍යම බල ආයතනයක් තුළ ඒකරාශී වී තිබේ නම් එය ඒකීය ආණ්ඩු ක්‍රමයයි."
i. ඒකීය ආණ්ඩුක්‍රම පවතින් රටවල් 02ක් නම් කරන්න. (ලකු02)
ii. ඒකීය ආණ්ඩු ක්‍රමයක් පැවතීමේ වාසි 03ක් ලියා දක්වන්න. (ලකු03)
iii.ආ)ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ දක්නට ලැබෙන ලක්ෂණ 02ක් සඳහන් කරන්න. (ලකු02)

ආ) ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව බලතල බෙදා ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකු03)